සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

No 30192

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, අගෝස්තු 1989
General Certificate of Education (Adv. Level) Examination, August 1989

# (06) සත්ත්ව විද්‍යාව I
# (06) Zoology I

| විෂය අංකය | | |
|---|---|---|
| 06 | S | I |

පැ. දෙකයි/*Two hours*

උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.

මෙම පත්‍රයේ ප්‍රශ්න සියල්ල ම පිළිතුරු සැපයීමට ඔබ වෑයම් කළ යුතු යි. එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් ඇති නමුදු නිවැරැදි පිළිතුර ඉන් එකක් පමණකි. ප්‍රශ්නයට හොඳ ම පිළිතුර හැටියට ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න. වඩා පහසු ප්‍රශ්නවලට පළමුවෙන් පිළිතුරු දෙන්න. කිසියම් ප්‍රශ්නයක් අපහසු බව හැඟුණොත් එය මඟ හැර කාලය ඉතිරි වුවහොත් දෙවනුව සලකා බැලීමට කල් තබන්න.

1. පහත සඳහන් ඒවායින් ආදි පෘථිවි වායුගෝලයේ නොතිබී යයි අනුමාන කළ හැක්කේ
   (1) කාබන්ඩයොක්සයිඩ් ය. (2) ඇමෝනියා ය. (3) මීතේන් ය.
   (4) ඔක්සිජන් ය. (5) ජල වාෂ්ප ය.

2. DNA අණුවෙහි කොඳු නාරටිය සෑදී තිබෙන්නේ
   (1) පියුරීනවලිනි. (2) පිරමිඩිනවලිනි. (3) ඩීඔක්සිරයිබෝසවලිනි.
   (4) සීනි පොස්පේට කාණ්ඩවලිනි. (5) නියුක්ලියොටයිඩවලිනි.

3. පහත සඳහන් ඒවායින් සත්ත්ව සෛලවල බහුලව ම ඇත්තේ
   (1) කාබොහයිඩ්රේට ය. (2) ලිපිඩ ය. (3) ඛනිජ ලවණ ය.
   (4) ප්‍රෝටීන ය. (5) ජලය ය.

4. ගොල්ගි දේහ
   (1) ස්නායු සෛලවල බහුල ය.
   (2) එන්සයිම සංශ්ලේෂණය කරති.
   (3) අන්තඃප්ලාස්ම ජාලිකාව සමග සබඳකම් නොදක්වති.
   (4) මයිටොකොන්ඩ්‍රියම්යන් නිපදවති.
   (5) සෛල ස්‍රාව අසුරා තබති.

5. මිනිසා ගේ නිර්වායු ශ්වසනයේ දී ග්ලූකෝස් අවසානයේ දී පරිවර්තනය වන්නේ
   (1) කාබන් ඩයිඔක්සයිඩ් සහ ජලයට ය.
   (2) කාබන් ඩයිඔක්සයිඩ් සහ පයිරුවික් අම්ලයට ය.
   (3) සිට්රික් අම්ලයට ය.
   (4) ලැක්ටික් අම්ලයට ය.
   (5) ඊතයිල් මධ්‍යසාරයට ය.

6. පහත සඳහන් ඒවායින් බහිරාසර්ග ස්‍රාවයක් නොවන්නේ
   (1) කිරි ය. (2) ශ්ලේෂ්මල ය. (3) ඩෙඩිය ය. (4) තයිරොක්සින් ය. (5) ට්‍රිප්සින් ය.

7. වකුගඩුවෙන් ඉටු නොවන කෘත්‍යය වනුයේ
   (1) පටක තරල පෙරීම ය. (2) හෝර්මෝන ස්‍රාවය කිරීම ය.
   (3) ජල සහ ලවණ තුලනතාව යාමනය කිරීම ය. (4) මුත්‍ර සෑදීම ය.
   (5) රුධිර පීඩනය පාලනය කිරීම ය.

8. යූරියා සම්බන්ධව පහත සඳහන් වගන්ති අතුරින් වැරදි වගන්තිය කුමක් ද? එය
   (1) අක්මාවෙහි සංශ්ලේෂණය වේ. (2) ප්‍රෝටීන බිඳ හෙලීමෙන් ව්‍යුත්පන්න වේ.
   (3) ක්ෂීරපායීන්ගේ පමණක් හමුවේ. (4) ජලයෙහි ද්‍රාව්‍ය වේ.
   (5) ශරීරය තුළ එකතු වුවහොත් විෂ වේ.

9. ක්ෂීරපායි කංකාල පේශී අධික කේශනාලිකා ඝනත්වයකින් සමන්විත වේ. මෙය අවශ්‍ය වනුයේ
   (1) කේශනාලිකා මංවයෙහි රුධිර පීඩනය පහළ බසින හෙයිනි.
   (2) රුධිරයත් පටකයත් අතර ද්‍රව්‍ය හුවමාරුව සිදුවන්නේ කේශනාලිකාවලින් හෙයිනි.
   (3) කේශනාලිකා තුළින් රුධිරය ගමන් කරන්නේ ඉතා සෙමින් බැවිනි.
   (4) ධමනි අග්‍රවල දී තරලය රුධිරයෙන් පිටවී, ශිරා අග්‍ර අසල දී නැවත ඇතුල් වන බැවිනි.
   (5) කේශනාලිකාවලින් පිටවන තරලයෙන් වැඩි කොටසක් ආපසු ඒවාට පැමිණෙන හෙයිනි.

10. පහත සඳහන් ද්‍රව්‍යයන් අතුරින් එකක් හැර අන් සියල්ල ම ප්‍රෝටීන ය. එය
   (1) ග්ලයිකොජන් ය. (2) කෙරටින් ය. (3) කයිටින් ය.
   (4) කොලැජන් ය. (5) ලයිපේස් ය.

11. රුධිර කැටියක් ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ,
(1) පට්ටිකාවලිනි. (2) පෙප්ටිඩින්වලිනි. (3) ත්‍රොම්බින්වලිනි.
(4) ෆෛබ්‍රිනොජන්වලිනි. (5) ත්‍රොම්බොප්ලාස්ටින්වලිනි.

12. මිනිසාගේ ප්‍රත්‍යාස්ථ කාටිලේජ හමුවන්නේ
(1) ශ්වසනාලයේ ය. (2) දික් අස්ථිවල ය. (3) කපාලයේ ය.
(4) පර්ශුවල ය. (5) නාස් ආවාරයේ ය.

13. චාලක ස්නායුවක් සෑදී තිබෙන්නේ
(1) ගැංග්ලියම්වලිනි. (2) සෛල දේහවලිනි. (3) අනුශාඛිකාවලිනි.
(4) අක්සනවලිනි. (5) ශ්වොන්සෛලවලිනි.

14. ඔබ, තුනී අස්ථි පෙත්තක් තනුක අම්ලයෙහි තැබුවහොත් එය,
(1) අවශේෂ නොමැතිව ඉක්මනින් දිය වේ. (2) තරල අවශෝෂණය හේතු කොට ගෙන ඉදිමේ.
(3) වෙනසක් නොපෙන්වයි. (4) අඩ වශයෙන් දිය වේ.
(5) හැකිලී, එහි හැඩය නැතිවී යයි.

15. පහත සඳහන් ඒවායින් පක්ෂ්ම හමු නොවන්නේ කුමන එකේ ද?
(1) Annelida (2) Arthropoda (3) Echinodermata (4) Mollusca (5) Platyhelminthes.

16. දංශක කෝෂ්ඨ හමු වන්නේ
(1) Annelida (2) Coelenterata (3) Mollusca (4) Nematoda (5) Platyhelminthes.

17. පහත සඳහන් Arthropoda වර්ග අතුරින් ස්පර්ශක දක්නට නොලැබෙන්නේ කුමන වර්ගයේ ද?
(1) Insecta (2) Crustacea (3) Chilopoda (4) Diplopoda (5) Arachnida

18. පරපෝෂිතයන් පමණක් අඩංගු වන්නේ පහත සඳහන් කුමන කාණ්ඩයේ ද?
(1) Asteroidea (2) Gastropoda (3) Nematoda (4) Polychaeta (5) Trematoda

19. පහත සඳහන් වගන්ති අතුරින් කැරපොත්තාගේ ස්නායු පද්ධතිය සම්බන්ධව වැරදි වන්නේ කුමක් ද?
(1) අධෝග්‍රසනිකා ගැංග්ලියම ඉස් කොපුව තුළ තිබේ.
(2) උදරීය ස්නායු රජ්ජුව ද්විත්ව වේ.
(3) උදර ගැංග්ලියම පහක් තිබේ.
(4) අධෝග්‍රසනිකා ගැංග්ලියම මුඛ කොටස්වලට ස්නායු සපයයි.
(5) අන්තිම උදර ගැංග්ලියම විශාල ය.

20. පහත සඳහන් ඒවායින් කැරපොත්තාගේ පෙර බඩවැලෙහි කොටසක් නොවන්නේ කුමක් ද?
(1) ග්‍රසනිකාව (2) අන්නස්‍රෝතය (3) ගොජ්ජ (4) වටනය (5) අන්ධාශ

21. පහත සඳහන් වගන්ති අතුරින් කැරපොත්තා සම්බන්ධව නිවැරදි වනුයේ.
(1) කැරපොත්තා තෙත් ස්ථානවල පොකුරු වශයෙන් බිත්තර දමයි.
(2) කැරපොත්තාට සරල මෙන් ම සංයුක්ත ඇස් ද තිබේ.
(3) පියාසර කිරීමේ දී පිටක පියාපත් යුගල වැදගත් වේ.
(4) ස්පර්ශක, ශ්‍රවණ ඉන්ද්‍රිය දරයි.
(5) උරස් ඛණ්ඩ සමහරක ශ්වාසරන්ධ්‍ර හමු වේ.

22. ගෙම්බා/මැඩියාගේ ස්නායු පද්ධතියෙහි
(1) හතරවැනි කෝෂිකාව මධ්‍ය මස්තිෂ්කය තුළ ඇත.
(2) කපාල ස්නායු යුගල දහයක් ඇත.
(3) රුධිර ග්‍රාහී ප්‍රධාන ආරක්ෂක ව්‍යුහයන් වේ.
(4) කේතු දේහය මධ්‍ය මස්තිෂ්කයේ උදරීයව පිහිටා ඇත.
(5) අනුමස්තිෂ්කය විශාල ව සහ හොඳින් විකසනය වී තිබේ.

23. පහත සඳහන් වගන්ති අතුරින් ගෙම්බා/මැඩියාගේ ශිරා පද්ධතිය සම්බන්ධ ව වැරදි වන්නේ කුමන වගන්තිය ද?
(1) වෘක්කීය ප්‍රතිහාර ශිරාව සෑදී ඇත්තේ කලව සහ ශ්‍රෝණි ශිරාවලිනි.
(2) අධෝක්ෂක ශිරාව පූර්ව මහා ශිරාවට සම්බන්ධ වේ.
(3) මහා ශිරා තුන ශිරා රුධිරාශයට සම්බන්ධ වේ.
(4) පූර්ව උදර ශිරාව ආමාශයෙන් සහ අන්ත්‍රයෙන් රුධිරය ලබා ගනී.
(5) කලව ශිරාවලින් ශ්‍රෝණි ශිරා පැන නගී.

24. ගෙම්බා/මැඩියාගේ සැකිල්ලෙහි පැනීම සහ පිහිනීම යන දෙකම සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් දක්වන්නේ පහත සඳහන් ලක්ෂණ අතුරින් කුමක් ද?
(1) කෙටි කශේරුව.
(2) උර මේඛලාව කශේරුවට ලිහිල්ව සම්බන්ධ වී තිබීම.
(3) සංයෝජනය වූ යුනික සහ කුකුන්දර අස්ථි.
(4) ත්‍රිකාස්ථික කශේරුකාවල පළල් වූ තිර්යක් ප්‍රසර.
(5) දික් වූ අපර ගාත්‍ර

25. මිනිසාට කිට්ටුම බන්ධුතාවයක් දක්වන සජීවී සත්ත්වයා ලෙස ජීව විද්‍යාඥයන් පවසනුයේ
(1) ගොරිල්ලා ය. (2) චිම්පන්සියා ය. (3) වඳුරා ය. (4) ගිබන් ය. (5) ඔරංඋටං ය.

26. ප්‍රිමාටේස් අතර වූ පහත සඳහන් ලක්ෂණවලින් මිනිසාට පමණක් අද්විතීය වන්නේ කුමක් ද?
(1) තනි යටි හනු අස්ථිය. (2) ග්‍රෛවී කශේරුකා හත.
(3) හොඳින් විකසනය වූ බල ග්‍රහණය. (4) ස්ථිර දෙපාවන් විලාසය.
(5) හොඳ ද්විනේත්‍රික දෘෂ්ටිය.

27. මිනිස් මොළයේ බුද්ධිය හා සම්බන්ධ ප්‍රදේශය වනුයේ
(1) ලලාට බණ්ඩිකාව. (2) දකුණු ශංඛක බණ්ඩිකාව. (3) වම් ශංඛක බණ්ඩිකාව.
(4) පාර්ශ්වික බණ්ඩිකාව. (5) අපර කපාල බණ්ඩිකාව.

28. පුරුෂයකුගේ සහ ස්ත්‍රියකගේ ශ්‍රෝණි මේඛලා අතර ඇති එක වෙනසක් නම්, ස්ත්‍රියකගේ සාමාන්‍යයෙන්
(1) යුනික අස්ථි සංයෝජනය විම ය. (2) ශ්‍රෝණි කුහරය පළල් වීම යි.
(3) අස්ථි බරින් වැඩිවීම යි. (4) ශ්‍රෝණිය පටු සහ ගැඹුරු වීම යි.
(5) යුනික චක්‍රය පටු වීම යි.

29. විද්‍යාඥයින් නියන්ඩතාල් මිනිසා සහ නූතන මිනිසා යන දෙදෙනාම *Homo sapiens* යන එක ම විශේෂයෙහි පිහිටුවා තිබේ. මෙයින් නිගමනය කළ හැකි වන්නේ
(1) පෙනුමෙන් ඔවුන් බොහෝ සේ එක හා සමාන වූ බව ය.
(2) ඔවුන් එක හා සමාන බුද්ධියකින් යුක්ත වූ බව ය.
(3) ඔවුන්ගේ හැසිරීම් රටා සම වූ බව ය.
(4) ඔවුන්ට එකිනෙකා සමග සංසර්ගයේ යෙදී ජනිතයන් බිහිකිරීමට හැකියාවක් තිබෙන්නට ඇති වග ය.
(5) ඔවුන්ගේ හිස්කබලේ රූපාකාරය සම වූ බව ය.

30. විශේෂයක පාරිසරික නිකේතනයක් නිර්ණය කිරීම සඳහා ඉතා අඩුවෙන් අදාල වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) ස්නායු රජ්ජුවේ ස්වභාවය. (2) ප්‍රජනක චක්‍ර.
(3) පරිභෝජනය කෙරෙන ආහාර වර්ගය. (4) උෂ්ණත්ව ධාරණතාව.
(5) බිහි කළ පැටවුන් සංඛ්‍යාව.

31. වායුගෝලීය ඔක්සිජන්වලට ප්‍රධාන කොටස සැපයෙනු ලබන්නේ
(1) කාවධාලාන පද්ධතිවලිනි. (2) කරදිය ශාක ප්ලවාංගවලිනි.
(3) නිවර්තන තෙත් වනාන්තරවලිනි. (4) තෘණ බිම්වලිනි.
(5) වගා කරන ලද ශාකවලිනි.

32. පොහොර යොදන ලද කුඹුරකින් කුඩා විලකට ජලය ගලා යයි. විල මත මෙයින් ඇති කරන මුල්ම ආචරණය විය හැක්කේ
(1) මත්ස්‍යයන් මැරී යාම ය. (2) ඔක්සිජන් ඉතා අධික ලෙස හීන වීම ය.
(3) ජලයෙහි දුගඳක් ඇති වීම ය. (4) නිර්වායු බැක්ටීරියා වැඩි වීම ය.
(5) ශාක ප්ලවාංග ඝනත්වය වැඩි වීම ය.

33. පහත සඳහන් වගන්ති අතුරින් නිවැරදි වගන්තිය කුමක් ද?
(1) පරිසර පද්ධති තුළින් ද්‍රව්‍ය ගලා යන්නේ සම්පූර්ණ චක්‍ර ලෙස ය.
(2) ආහාර දම්වල අනුයාත පුරුක් අතර ශක්තිය ක්ෂය වීමක් සිදුවේ.
(3) ශාක මගින් ලබා ගත් සූර්ය ශක්තියෙන් වැඩි කොටසක් ප්‍රභාසංශ්ලේෂණය මගින් තිර කරනු ලැබේ.
(4) ආහාර දමයක තිබෙන උපරිම පුරුක් සංඛ්‍යාව තුනකි.
(5) වැඩිම ජෛව ස්කන්ධයක් තිබෙන්නේ ආහාර දමයෙහි ඉහළ අග්‍රයේ ය.

34, 35 සහ 36 වැනි ප්‍රශ්න පදනම් වී ඇත්තේ රූපයේ සඳහන් ප්‍රස්තාර මත ය.




34. ස්ථාවර සත්ත්ව ගහනයක් නිරූපණය කෙරෙන්නේ කුමන ප්‍රස්තාරයෙන් ද
(1) A. (2) B. (3) C. (4) D. (5) E.

35. මිනිස් ජනගහණ වර්ධනයක් නිරූපණය කෙරෙන්නේ කුමන ප්‍රස්තාරයෙන් ද?
(1) A. (2) B. (3) C. (4) D. (5) E.

36. මිනිසකුගේ දර්ශීය වර්ධන රටාව පෙන්නුම් කරන්නේ කුමන ප්‍රස්තාරය ද? (Y අක්ෂය ප්‍රමාණය පෙන්නුම් කරයි.)
(1) A. (2) B. (3) C. (4) D. (5) E.

37. *Entamocba histolytica* ආසාදනය සිදු නොවන්නේ
(1) වේවය (2) ආහාරය (3) ජලය (4) මළ (5) මුත්‍ර මගිනි

[ අනෙක් පිට බලන්න.

38. ශ්‍රී ලංකාවේ මැලේරියාව මැඩීමට හැකි ප්‍රබල ම මාර්ගය වනුයේ
(1) මදුරුවන් දෂ්ඨකිරිමෙන් වැළකී සිටින ආකාරය මිනිසුන්ට ඉගැන්වීමෙන්.
(2) මදුරුවාගේ ජීවන චක්‍රය සම්පූර්ණ කිරීම වැලැක්වීමෙන්.
(3) මදුරුවන්ගේ අභිජනනය වැළැක්වීමෙනි.
(4) ඖෂධ මගින් රක්තාශ්‍රිත අවස්ථා පාලනය කිරීමෙනි.
(5) ඖෂධ මගින් අක්මාවේ අවස්ථා පාලනය කිරීමෙනි.

39. ජෛව පාලන ක්‍රමයක් මගින් ජලජ වල් පැලෑටියක් වන *Salvinia molesta* පාලනය කිරීමට මෑතකදී ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් සමත් විය. මේ සඳහා යොදාගත් කෘමි විශේෂය අයත් වන්නේ
(1) *Leptocoriza* (2) *Nilaparvata* (3) *Orseolia* (4) *Cryptobagus* (5) *Nymphula*, වය.

40. පහත සඳහන් පළිබෝධ පාලන ක්‍රම අතුරින් පරිසරය සුරැකීම සම්බන්ධයෙන් ඉතාමත් ප්‍රායෝගික වනුයේ,
(1) ප්‍රබල කෘමි නාශක භාවිතය යි.
(2) ජෛව සාරක පාවිච්චිය යි.
(3) පරෙස්සම් සහිත රෝපණ පිළිවෙත් අනුගමනය කිරීම යි.
(4) සමෝධානික පාලන ක්‍රම යි.
(5) ප්‍රවේණික ව ප්‍රතිරෝධක ප්‍රභේද විකසනය කිරීම යි.

41. *Oreochromis mossambicus (Tilapia mossambicus)* ගේ අංශ රේඛාව
(1) කොටස් දෙකකින් යුක්ත ය.
(2) පියවි ඇසින් දැක ගත නොහැකි ය.
(3) පෘෂ්ඨීය මධ්‍ය රේඛාවට දළ වශයෙන් සමාන්තරව පවතී.
(4) හොම්බ අග්‍රයේ සිට වලිගයේ මූලය දක්වා විහිදේ.
(5) ආසාතික ය.

42. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මත්ස්‍යය නිෂ්පාදනයට දායක වන ප්‍රධාන විශේෂය වනුයේ
(1) *Oreochromis niloticus (Tilapia niloticus)* (2) *Oreochromis mossambicus (Tilapia mossambicus)*
(3) *Ophicephalus striatus* (4) *Cyprinus carpio* (5) *Ctenopharyngodon idella*

43. 'සියුම් මත්ස්‍යය රෝපණය' සඳහා අඩුවෙන්ම ම වැදගත් වන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) සුදුසු ජල උෂ්ණත්වය. (2) නිපැයූ මත්ස්‍යයන්ගේ රස.
(3) උසස් තත්ත්වයෙහි ආහාර සැපයුම. (4) පැටවුන්ගේ අධික ඝනත්වය.
(5) ක්‍රමවත් පිරිසිදු ඔක්සිජනීකෘත ජල සැපයුම.

44. යුකැරියෝටාවන්ගේ ජානය සම්බන්ධ ව ඇති පහත සඳහන් වගන්ති අතුරින් වැරදි වන්නේ කුමක් ද? ජානය
(1) විභින්න ඒකකයකි. (2) විකෘති වීමේ හැකියාව සහිත ය. (3) DNA වල අනුපිළිවෙලකි.
(4) යුගල වශයෙන් පිහිටයි. (5) තනි ඇලීලයකින් පමණක් සහිත විය හැකි ය.

45. පහත සඳහන් ඒවායින් ආවේණික නොවන්නේ කුමක් ද?
(1) උස. (2) ශක්තිමත් පේශි. (3) ඇසෙහි වර්ණය. (4) හමෙහි වර්ණය. (5) ඇලිබව.

46. 'A' ජානය පිරිමියකුගේ X වර්ණ දේහයෙහි පවතී. ඊළග පරම්පරාවට එය සම්ප්‍රේෂණය වූ විට එය,
(1) ජනිතයන් සියල්ලගේ ම තිබේ. (2) ස්ත්‍රීන් සියල්ලකගේ ම තිබේ.
(3) ස්ත්‍රීන්ගෙන් හරි අඩක තිබේ. (4) පිරිමි සියල්ලකගේ ම තිබේ.
(5) පිරිමින්ගෙන් හරි අඩක තිබේ.

47. පරිණාමය සිදුවීමට පහත සඳහන් ඒවායින් අත්‍යාවශ්‍ය වනුයේ කුමක් ද?
(1) ප්‍රජනනය, (2) දේශගුණික වෙනස්කම්. (3) පරිසරයේ වෙනස්කම්.
(4) විශේෂ අතර තරඟය. (5) ගහණ සංඛ්‍යා අඩුවීම.

48. ඩාවින් විසින් යෝජනා කරන ලද පරිණාම වාදයෙහි ප්‍රධාන දුර්වල කමක් වූයේ,
(1) එය ජීවය ආරම්භ වූ හැටි පැහැදිලි නොකිරීමයි.
(2) ආවේණි ක්‍රියාවලිය වැරදි ලෙස විස්තර කිරීමයි.
(3) DNA ගැන සඳහනක් නොකිරීමයි.
(4) මානව පරිණාමය පිළිබඳ විස්තර නිරවද්‍ය නොවීම යි.
(5) වංශ ප්‍රවේණිය ගැන පැහැදිලි කිරීමක් නොතිබීමයි.

49. පහත සඳහන් ගොයම් පළිබෝධයන් අතරින් විකසනය වන සහල් ඇට මත පමණක් යැපෙන්නේ කුමන පළිබෝධයා ද ?
(1) ගැට මැස්සා (ගෝල් මැස්සා) (2) පස්පැහි මකුණා (3) ගොයම් මැස්සා
(4) ගොඩබෙල්ලා (5) කොපු පණුවා

50. මිනිසාගේ ආහාර මාර්ගයෙහි පහත සඳහන් කොටස්වලින් මිනිස් සිරුරෙහි ඉහළින් ම පිහිටා තිබෙන්නේ කුමන කොටස ද?
(1) ආරෝහණ මහාන්ත්‍රකය. (2) තිර්යක් මහාන්ත්‍රකය. (3) අවරෝහණ මහාන්ත්‍රකය.
(4) ආමාශය. (5) ග්‍රහණිය.

51. මිනිසාගේ ශ්වසන පද්ධතිය සම්බන්ධව පහත සඳහන් වගන්ති අතුරෙන් **වැරදි** වගන්තිය කුමක් ද.
(1) ගර්තවල බහුස්තර බිත්ති ඇත.
(2) වායු හුවමාරුව සිදුවන්නේ ගර්තික පෘෂ්ඨකයේ දී ය.
(3) පෙනහැල්ලක් වෙනම කුටීරයක ආවරණය වී ඇත.
(4) ශ්වාසනාලිකා කාටිලේජ මුදු මගින් දරා ඇත.
(5) ආශ්වාසය සිදුවන්නේ පෙනහැල්ලත් පරිසරයත් අතර ඇති පීඩන වෙනස්කම් හේතු කොට ගෙන ය.

52. සජීව ජීවීන්ගේ ශක්තිය ගබඩා කිරීම සඳහා වැදගත් වන්නේ පහත සඳහන් මූල ද්‍රව්‍යවලින් කුමක් ද?
(1) නයිට්‍රජන්. (2) හයිඩ්‍රජන්. (3) සල්ෆර්. (4) යකඩ. (5) පොස්පරස්.

53. AIDS වයිරසය
(1) වකුගඩුවෙහි සෛල ආසාදනය කරයි. (2) T - වසා සෛල මත බලපායි.
(3) රුධිරාණු විනාශ කරයි. (4) අක්මා පටක තුවාල කරයි.
(5) ප්‍රජනක පද්ධතියේ සෛල තුළ එක් රැස්වේ.

54 හා 55 වැනි ප්‍රශ්න පදනම් වී ඇත්තේ පහත සඳහන් තොරතුරු මත ය.

මැලේරියා මදුරුවන් පාලනය කිරීම සඳහා ගමක ගෙවල්වලට DDT ඉසින ලදී. DDT වලින් කොටසක් පහත සඳහන් ආහාර දමයට ඇතුළු විය.




54. DDT එක්රැස්වීමෙන් වැඩියෙන්ම මරණයට ගොදුරු විය හැකි සතුන් වනුයේ
(1) බළලුන් (2) කැරපොත්තන් (3) ගෙමැස්සන් (4) හූනන් (5) මීයන්.

55. සර්වභක්ෂකයන්ට වඩා විලෝපීන් සංඛ්‍යාව අඩුය, යන කරුණ සිතෙහි තබා ගනිමින්, 54 වෙනි ප්‍රශ්නයෙහි සඳහන්කල සතුන්ගේ මියයෑමේ ප්‍රතිඵලයක් වශයෙන් සංඛ්‍යාවෙ අධිකතම වැඩිවීමක් පෙන්නුම් කරනුයේ පහත සඳහන් සතුන්ගෙන් කවරෙකු ද?
(1) බළලුන් (2) කැරපොත්තන් (3) ගෙමැස්සන් (4) හූනන් (5) මීයන්.

56. ඔබ ගල්පර සහිත මුහුදු වෙරළක ඇති ගලක පෘෂ්ඨය අධ්‍යයනය කළහොත් ඔබට සොයා ගැනීමට නොහැකිවිය හැක්කේ පහත සඳහන් ජීවායින් කුමක් ද?
(1) මුහුදු ඇනිමෝනියා. (2) බෙලි ඇනයා. (3) අට පියල්ලා.
(4) තුන්තුඹුවා. (5) මුහුදු කැකිරියා.

57. ඔබ ගෙම්බෙකුගේ/මැඩියෙකුගේ උදර කුහරය ශ්‍රෝණි මේඛලාවේ මට්ටමේ සිට අක්මාවේ යට මට්ටම දක්වා විවෘත කළහොත් පහත සඳහන් වාහිනී අතුරින් දෘශ්‍යමාන නොවනුයේ
(1) පූර්ව උදර ශිරාව ය. (2) වෘක්ක ප්‍රතිහාර ශිරාව ය. (3) යාකෘතික ශිරාව ය.
(4) ශ්‍රෝණි ශිරාව ය. (5) අපර මහා ශිරාව ය.

58 සහ 59 වැනි ප්‍රශ්න පහත සඳහන් ක්ෂීරපායී ගෝත්‍ර මත පදනම් වී තිබේ.

(A) **Primates** (B) **Chiroptera** (C) **Perissodactyla** (D) **Cetacea** (E) **Artiodaclyta**

58. ඉහත සඳහන් ක්ෂීරපායී ගෝත්‍ර අතුරින් අධි වේගයෙන් දිවීම සඳහා ඉතා හොඳින් අනුවර්තනය වී ඇති සතුන් අඩංගු වනුයේ
(1) A (2) B (3) C (4) D (5) E හි ය.

59. ඉහත සඳහන් ක්ෂීරපායී ගෝත්‍ර අතුරින් ද්විනේත්‍රික දෘෂ්ටිය විකසනය වී ඇති සතුන් ඇතුලත් වී ඇත්තේ
(1) A (2) B (3) C (4) D (5) E හි ය.

60. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය රටට විශාල වාසි ගෙන දෙයි. එසේ වුවද වන සතුන්ට හානියක් සිදුවිය හැකියි. පහත සඳහන් සතුන් අතුරින් වැඩියෙන් ම බලපෑමක් ඇතිවිය හැකි වනුයේ
(1) කිඹුලන්ට ය. (2) මී හරකුන්ට ය. (3) වල් ඌරන්ට ය.
(4) අලින්ට ය. (5) වඳුරන්ට ය.